සැබැවින්ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මළපහ කිරීමෙන් පසු බැහැර වූ විටෙක, එතුමාණෝ "ගුෆ්රානක" (ඔබෙන් සමාව අයැද සිටිමි) යැයි පවසන්නෙකු වූහ

දේවත්වය විශ්වාස කරන, මුඃමින්වරුන්ගේ මෑණියක් වූ ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ වාර්තා කරන ලදී. සැබැවින්ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්
මළපහ කිරීමෙන් පසු බැහැර වූ විටෙක, එතුමාණෝ "ගුෆ්රානක" (ඔබෙන් සමාව අයැද සිටිමි)
යැයි පවසන්නෙකු වූහ.
[صحيح] [رواه أبو داود والترمذي وابن ماجه وأحمد]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මළ පහ කිරීමෙන් තම අවශ්යතාව ඉටු කිරීමෙන් පසු බැහැරව ගිය විට 'ගුෆ්රානක' යැයි පවසා දෙවියනි! මම ඔබෙන් සමාව අයදිමි' යැයි පවසන්නෙකු වූහ.

https://sunnah.global/hadeeth/si/show/10046